

# අවකලනය සහ අවනීතිය



## පමා නොවී එමි අකුරට

රසික සූරියආරච්චි ලියයි

මගේ මව්පාර්ශවයේ ඥාතීන් ද, පිය පාර්ශවයේ ඥාතීන් ද, සියළු දෙනාම පාහේ යූඇම්පි කාරයෝ වූහ. අප කුඩාකල හැදී වැඩුනේ පියා ගේ මහගෙදර වූ නිසා ඒ දේශපාලනික අදහස් මගේ සිතට ද ටිකෙන් ටික කා වැදෙන්නට ඇත.

හැට ගණන්වල සිටම ගමේ එජාප තරුණ ශාඛාවේ ලේකම් වූයේ මගේ බාප්පා ය. පෞද්ගලික අංශයේ රැකියා සඳහා ඔහුට චරිත සහතික ලියා දී තිබුණේ ඩඩ්ලි සහ ජේආර් විසිනි. වෙසක් වලට ඔහු පත්තු කළේ කොල පාට බකට් පමණි. හැත්තෑවේ මහ මැතිවරණයේ දී එජාපය එක දිගට පැරදෙද්දී මා දුටු ඔහුගේ දුක්මුසු මුහුණ තවමත් මගේ මතකයේ ඇත.

මගේ පියා එළිපිට දේශපාලනය කතා කළ අයෙකු නොවුණත් ඔහු ද, තම නැණවත්කමට ද නොගැලපෙන පරිදි සිතෙන් හෝ දැඩි යූඇම්පිකාරයෙකු වූයේ ඇයි දැයි මට අද ද සිතාගත නොහැක. එය යූඇම්පීයේ තිබූ සුවිශේෂිතාවයක් නිසා සිදුවූවක් නොව අනෙකුත් දේශපාලන ප්‍රවාහයන් හි තිබූ අඩුලුහුඬුකම් නිසා සිදුවූවක් යැයි සිතමි.

ගහේ කටු උල්කල නොයුතු වන්නාක් සේ මම ද හතේ අටේ පන්තිවල පටන්ම දේශපාලනික සත්වයෙක් වීමි. සමගි පෙරමුණු රජයේ ප්‍රචාරක මාධ්‍යය වූ ගුවන් විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශන අපේ නිවසේ කිසිදිනක නොඇසුණි. කලාවැව, කැස්බෑව යනාදී අතුරු මැතිවරණ ප්‍රතිපලවලින් මා අපමණක් තුටු වුණෙමි. සිංහල වාක්‍ය රචනාවල, සමාජ අධ්‍යයන ක්ෂේත්‍ර සටහන් පොතේ මා තැබූ ලියූ සටහන් යූඇම්පීයට ඉතා පක්ෂග්‍රාහී වූ ඒවා විය.

කොටින්ම, 1977 මැතිවරණයේදී එකල මා සමග එකම පන්තියේ උගත්, දැන් මෙල්බර්න් පුරයේ වෙසෙන මිතුරෙකු හා යූඇම්පීය දිනන බවට චන්ද ඔට්ටුවක් අල්ලා රුපියල් පහක් ද දිනුවෙමි.

යූඇම්පීයේ ඒ ජයග්‍රහණය ගැන එකල අවුරුදු දහතර හමාරක කොළු ගැටයෙකු වූ මා ලියූ පිටු විසිපහක පමණ වාක්‍ය රචනාව හොඳම රචනාව ලෙසින් ආනන්ද විද්‍යාලයේ දහවැනි ශ්‍රේණියේ අපේ සිංහල ගුරුවරයා ගේ සුවිශේෂී පැසසුමට ද ලක්විය.

යූඇම්පියේ රජය ඇරඹුණේ අප සැමගේ දහසක් බලාපොරොත්තු සමගිනි.

එසේ වුවද, එතෙක් පැවති සංවෘත ආර්ථික ක්‍රමය වෙනුවට ආදේශිත විවෘත ආර්ථිකයේ සෑම ප්‍රතිපලයක්ම රටේ සැමට සුහදායී නොවුණි. පුද්ගලික බස් රථ, සිලි-සිලි බෑග්, ත්‍රී-රෝද රථවල ආගමනයත් සමගම ජීවන වියදම ද ඉහල ගියේය. රටේ ප්‍රකාශිත ආර්ථික අපේක්ෂාව වූයේ -රොබර් බැරන්" ලා ගේ සම්ප්‍රාප්තිය බව කියවිණි.

මුදලේ අවශ්‍යතාවය සියළු දෙනාටම වඩවඩාත් දැනේනට වූ අතර ආර්ථික දියුණුවේ ප්‍රතිලාභ විෂමාකාරව බෙදී යාම තුලින් ඇති නැති පරතරය වැඩිවන්නට විය.
රාජපක්ෂිකයින් ට සහ මුදල් ඇත්තන්ට එක් ලෝකයක් ද, අනෙක් පිරිස්වලට වෙනත් ලෝකයක් ද මැවෙමින් පවතින බැව් මගේ ගැටවර මනසට වැටහෙන්නට පටන් ගත්තේය.
මේ මා උසස් පෙළ ගණිතය හදාරන්නට පටන් ගත් අවධියයි. ශුද්ධ ගණිතය විෂය මාලාවේ එන අවකලනය නම් වූ සංකල්පය උගෙනිද්දී මගේ සිතේ රැඳුණු එක් ප්‍රශ්ණයක් කවියක් ලෙසින් එළියට ආවේ පවතින සමාජ අසාධාරණය දෙන මගේම වූ ගණිතමය ඇසකින් විපරම් කරමිණි.

අද පමානොවී එමි අකුරට කොලමෙන් මා ඉදිරිපත් කරන්නේ මා එද ආනන්ද විද්‍යාලයේ උසස් පෙළ සිසුවෙකු ලෙස උගත්දී පබැඳූ කවියයි.

### අවකලනය-අවනීතිය

නිලයට බලයට ධනයට යටවුනු
යුක්තිය අද අතවැසියෙක් ගානයි
අසාධාරණය රජවුණු ලෝකයෙ
නීතිය අද අවකලනය ගානයි

දුප්පත් එකාට එක සැලකිල්ලකි
පෝසත් එකාට තව සැලකිල්ලකි
යුක්තිය නැත නිසි ලෙස පසැදෙන්නේ
අවලකනය මෙනි තීන්දු එන්නේ

ඊ-එක්ස් (ඍ) සහ කේ (න) ශ්‍රිතයන් ඇත්තේ
මේවා අවකලනය කළ යුත්තේ
කේ අවකලනය කළ විට බින්දුව
ඊ-එක්ස් එයමය හරිද තීන්දුව?

අසරණ කේ ලා නීතිය හමුවේ
දඬුවම් ලැබිලා වැනසෙන්නේ
බලගතු ඊ-එක්ස් ල ට නැත දඬුවම්
යහතින් සැමද වැජඹෙන්නේ

නීතිය සව් නැති මකුළු දැලක් වේ
මැසි මදුරුවෝ ය පැටලෙන්නේ
තෝරුන්, මෝරුන් සහ මහ වවුලන්
දැල බිඳගෙන ඉගිලී යන්නේ

මා උසස් පෙළ ලියා දැන් වසර තිස් දෙකක් ගතවී ඇත. අරුං වෙනුවට මුං ආදේශ වීම මිස වෙනත් හොඳ අතට වෙනසක් මට නම් දකින්නට නැත.
එද මා ලියූ ආකාරයේ අවකලනයේ අවනීතිය අද ද එලෙසම පවතින බව සිහිපත් කරමින් මේ ලිපිය අවසන් කරන්නට සිදුවීම කෙතරම් කණගාටුවට කරුණක් ද?

## සුබස් සිතිවිලි

# සුභාෂිතයෙන්....



වි ක ධර්මබන්ධු

තමන්හට නොසමයන් වන කලව සම
මුවෙන් නොබැන ඉවසනු සුදන ගරු කම
නොමින් කුමුදු වන විකසිත වනු දැක ම
විලින් මෙන් තඹුරු මුකුලිත වේය හැම

**ඒ කවිය ගැදි පැදියෙන් ;**

තමන් හට නොසමයන්
සම වන නොබැන ඉවසනු
සුදන ගරු කම
කුමුදු වන
නොමින්
විකසිත වනු දැක
හැම තඹුරු
විලියෙන්
මුකලිත වේ ය.

**අදහස :**

තමන් හට සම නුවුවන්, තමන් හා සම වු විට නොහොත් සම වන්නට තැත් කරන විට, නිහඬව ඉවසාගෙන සිටීම සුදනන්ගේ ගව්රවය පිනිස හේතු වේ. මානෙල් වනය (තමන් වට කොට) පිපෙන හැටි බලා නෙලුම් මල් ලජ්ජාවෙන් මෙන් හැකිලී යයි.

සුදනන්ගේ නිහැඬියාව (හරියට) මානෙල් මල් පිජේන සැටි බලා හැකිලෙන නෙලුම් මල් වැනිය.

**විස්තර :**

මෙහි සුදනන් ලෙස සැලකෙන්නේ නෙලුම්ය. නෙලුමේ සුදු /රත් පැහැය නිසා විය යුතුය. රත් පෑ සුදන නෙලුමට සම නොවන්නේ නිල් පෑ දුදන මානෙල්ය. ඔබ කැමති නම් පැහැපත් ගෑනුන් සුදනියන් ලෙසත් පැහැපත් නොවු ගෑනුන් දුදනියන් ලෙසත් හැඳින්විය හැකිය.

මා දුටු එක්තරා සිදුවීමක් මට මෙහි දී සිහිපත් වේ. විබාග දෙපාර්තමේන්තුවේ ප්‍රශ්න පත්‍ර අංශයේ එක් උප පරීක්ෂකයකුගේ ලියවිල්ලක "කෲර" යන වදනය දුටු ප්‍රදන පරීක්ෂකයා ඒ වචනය සදෙස් බවත් එය කියවෙන්නේ "ක්ර්ර්ර" යනුවෙන් බවත් එය නිවැරදිව ලියන්නේ "ක්‍රෑර" යන විදියට බවත් පැවසුවේ ය.

"ඒ උනාට හුග දෙනෙක් ලියන්නෙ (කෲර) ඒ විදියට නේ !" ප්‍රදන පරීක්ශකයා ඔහුගේ මුහුනත බලා නිහඬ ව ඉවත බලා ගත්තේ ය.

ඒ ප්‍රදන පරීක්ෂකයා මෙන් සුදනකු වීමට මට නොහැකිය. ඒ ගැන මම කනගාටු වෙමි.

පරිගණක අලුත්වැඩියාව
Professional Services
# Computer Repairs & Upgrades
# Virus Removals
# ADSL Professional installations
# Networking
# Brand New Computers for sales
# Laptop screen repairs
# Trouble shooting Browsing, E-mail & internet connection issues
# All Computer parts for low price
Jithendra Weerakoon
(IT Consultant)
02 Mosstrooper Court
Mill Park
Victoria, 3082
Australia
M: 0422 662 218
T: 03 9005 0893
E: jaytec@tpg.com.au
E: jith710@hotmail.com

Tripple Gem
Video & Audio Production
Videography and Photography
Keep your memories forever
Weddings
Parties
Functions



Vijitha
Tel - 0412 083 876/ 94495635